# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2025

## සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය - 2025

අ.පො.ස. (උ.පෙළ) විභාගය 2025 නොවැම්බර් මස 10 දින ආරම්භ කර 2025 දෙසැම්බර් මස 05 වන දින දක්වාත්, 2025 සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය 2025 දෙසැම්බර් මස 06 වන දිනත් පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම විභාගය සඳහා පෙනී සිටින පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර අදාළ පාසල අයත් කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ලබාදී ඇති අතර, සියලුම විදුහල්පතිවරුන් තම පාසලට අදාළ කලාප අධ්‍යාපන කාර්යාලයේ විභාග විෂයභාර සහකාර / නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ප්‍රවේශ පත්‍ර භාර ගත යුතුය. කිසිදු ප්‍රමාදයකින් තොරව **පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර ඔවුන් වෙත වහාම බෙදා දිය යුතුය.**

අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා පෙනී සිටින පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර ඔවුන්ගේ පෞද්ගලික ලිපිනයට තැපැල් මගින් යොමු කර ඇත.

උක්ත විභාග සඳහා අයදුම්කළ සියලුම අයදුම්කරුවන් සඳහා www.doenets.lk ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියට පිවිස 2025.11.03 දින සිට ප්‍රවේශ පත්‍ර බාගත කිරීම සිදුකර ගත හැක. සියලුම පාසල් අයදුම්කරුවන් සඳහා වන ප්‍රවේශපත්‍ර පෞද්ගලිකව බාගත කළ නොහැකි අතර, තම පාසල් මගින් එම කාර්යය සිදු කර ගත යුතු බව අවධාරණය කරමි.

අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා ප්‍රවේශපත්‍ර නොලැබුණු හෝ ප්‍රවේපත්‍ර බාගත කරගත නොහැකිවූ පෞද්ගලක අයදුම්කරුවන් වෙතොත් තමා ඉදිරිපත් කළ ඉල්ලුම්පතේ පිටපතක්, විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් හෝ විභාග ගාස්තු ගෙවූ බවට තැපැල් ස්ථානාධිපතිගෙන් ලබා ගත් සහතික කළ ලිපියක් සමග විභාග දෙපාර්තමේන්තුවට පැමිණිය යුතුය.

විදුහල්පතිවරුන් හෝ පෞද්ගලික අයදුම්කරුවන් වෙත ලැබී ඇති ප්‍රවේශ පත්‍රයන්හි විෂයය, මාධ්‍යය හා නාම සංශෝධන සිදු කර ගැනීමට ඇත්නම්,

- ➢ **සියලුම සංශෝධන මාර්ගගතව සිදු කර ගත යුතු අතර, ඒ සඳහා** https://onlineexams.gov.lk/eic **වෙබ් අඩවිය වෙත පිවිසිය යුතුය.**
- ➢ **එක් අයදුම්කරුවකුට මෙම සංශෝධන සිදු කර ගැනීමට ලැබෙනුයේ එක් අවස්ථාවක් පමණි.**
- ➢ **මෙම විභාගයේ විභාග මධ්‍යස්ථාන මාරු කිරීම් සිදු කරනු නොලැබේ.**
- ➢ **සංශෝධන සිදු කිරීම 2025.10.31 මධ්‍යම රාත්‍රී 12.00ට අවසන් වේ.**

අයදුම්කරුවන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය මෙම විභාගය සඳහා පිළිගත් අනන්‍යතා පත්‍රයක් වශයෙන් පිළිගනු ලැබේ.

1. අයදුම්කරුවකු වෙනුවෙන් වෙනත් අයකු විභාගයට පෙනී සිටීම, සටහන් ළඟ තබාගෙන පිළිතුරු සැපයීම, වෙනත් අයදුම්කරුවකුගේ උදව් ලබා ගැනීම, උදව් දීම හා විභාග ශාලාවේ හා ඒ අවට නොමනා හැසිරීම විභාග පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
2. අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ගිණුම්කරණය, ඉංජිනේරු තාක්ෂණවේදය, ජෛව පද්ධති තාක්ෂණවේදය සහ තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් සඳහා පමණක් වැඩසටහන් සම්පාදනය කළ නොහැකි සාමාන්‍ය ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.
3. දැනටත් කිසියම් රජයේ පාසලක ඉගෙනුම ලබන අයකු පෞද්ගලික අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේය.
4. විභාග ශාලාව තුළට ජංගම දුරකථන, ස්මාට් වොච් හෝ ඉලෙක්ට්‍රොනික උපාංග රැගෙන ඒම, සන්තකයේ තබා ගැනීම හා භාවිතය සපුරා තහනම් වේ. මෙම නියමය කඩ කරන අය වසර පහක විභාග තහනමකට ලක් විය හැකි අතර, අදාළ උපාංග රාජසන්තක වීමට ද ඉඩ ඇත.
5. විභාග අපේක්ෂකයන් බ්ලූටූත් (Bluetooth) වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ/උපාංග (Electronic Communication Devices) භාවිත නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ තම මුහුණ සහ කන්දෙක විවෘතව පැහැදිලිව පෙනෙන සේ තබා ගත යුතුය. එම විභාග නීති උල්ලංඝනය කරනු ලබන අපේක්ෂකයින් සඳහා නීත්‍යානුකූලව කටයුතු කරනු ලැබේ.

**විමසීම්** : **දුරකථන අංක** : **011 - 2784537, 011-2784208, 011-2786616.**
**විද්‍යුත් ලිපිනය** : gcealexam@gmail.com, gitexams24@gmail.com
**ෆැක්ස් අංකය** : **011-2784422**
**ක්ෂණික ඇමතුම්** : **1911**
**තැපැල් ලිපිනය** : **විභාග කොමසාරිස්, පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල.**

**විභාග කාල සීමාව තුළ පැය 24 පුරාම ක්‍රියාත්මක මෙහෙයුම් මැදිරිය**
**දුරකථන අංක : 0112785211, 0112784208, 0112784537, 0112786616**
**ක්ෂණික ඇමතුම් අංකය : 1911**

**ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ**
**විභාග කොමසාරිස් ජනරාල්.**

**6/3/AL/2025**
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2025.10.23 දින

tamilguru.lk